**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවද, එදිනම ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදා භට පිරිස්, රජයේ ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු යුද්ධ හමුදා සම්පත් යොදාගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල යුද්ධ හමුදා ගොවිපළවල් 10 ක් ඇතුළු ආදායම් උපදවන ව්‍යාපෘති තුලින් සමාලෝචිත වර්ෂයේ තෙවන කාර්තුව අවසාන වන විට පමණක් එකතුව රු.මිලියන 170.16 ක ශුද්ධ ආදායමක් උපයා තිබුණද, මෙම ආදායම් මූල්‍ය ප්‍රකාශන වලින් ආනාවරණය කර නොතිබුණි. | මෙම ආදායම් පිළිබඳව නියාමනයන් මහා භාණ්ඩාගාරය මඟින් සිදු කරනු ලබන බව. | යථෝක්ත ආදායම සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |

**(ආ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශන වලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 2,780.41 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම සහ අත්පත් කරගැනීමේ වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) රු.මිලියන 307.71 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූලධන වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| ii. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ- 6) වත්කම් වර්ග 09 ක කපාහල අගය රු.මිලියන 294.05 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, රු.මිලියන 821.34 ක සත්‍ය කපාහල අගයන්ද පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෙළිදරවු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කපාහළ නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ඇතුළත් වත්කම් වර්ග 68 ක පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී රු.බිලියන 14.83 ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි. | CIGAS" පද්ධතියේ දෝෂයක් මත හටගෙන ඇති අතර, පසුව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් නොසැසඳීමට හේතුව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |
| ii. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 6) ගොඩනැගිලි, ඉදිකිරීම් සහ නිවාස නොවන ගොඩනැගිලි ලෙස එකතුව රු.බිලියන 1.48 කට | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ වත්කම් වල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය |

| | | | |
|---|---|---|---|
| | අයත් ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශන මගින් වැඩියෙන් අනාවරණය කර තිබුණි. | | ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම. |
| iii. | යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි යුද්ධ හමුදාවට අයත් බිම් කැබලි 106ක එකතුව අක්කර 4,439 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | දීර්ඝ කාලයක සිට පරිහරණය කරන යුද්ධ හමුදාවට අයත් ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම. |
| iv. | සමාලෝචිත වර්ෂයේ කෘෂි කාර්මික හා සත්ව පාලන ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන අයිතමයන් මිලදී ගැනීම හා අශ්වයින් ප්‍රවාහනය කිරිම සඳහා රථයක් නිර්මාණය කිරීම ඇතුළු වාහන අටකට සිදුකළ එකතුව රු.මිලියන 54.73 ක ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියා වියදම් ද, යුද්ධ හමුදාවට පරිත්‍යාග/ ආධාර ලෙස ලැබුණු රු.මිලියන 119.51 ක් වටිනා ප්රාග්ධන භාණ්ඩ සහ උපකරණ ද, ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළ යුතු වීම. |
| v. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) අනුව සමාලෝචිත වර්ෂ අවසානයට සත්‍ය නොනිම් වැඩ ශේෂය රු.බිලියන 9.05 ක් ලෙස දක්වා තිබුණද, පසුගිය වර්ෂ කිහිපය තුළදීම වැඩ නිමකරන ලද රු.බිලියන 7.59 ක ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිත නොකර මෙම නොනිම්වැඩ වටිනාකම යටතේම දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැඩ නිම කළ වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළ යුතු වීම. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගණුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) වත්කම් කාණ්ඩ 05 කට අදාළව වත්කම් වර්ග 28 ක එකතුව රු.බිලියන 42.06 ක් ආරම්භක ශේෂයට කරන ලද එකතු කිරීම් ලෙස දක්වා තිබුණද ඒ සම්බන්ධ නිශ්චිත තොරතුරු අනාවරණයක් සිදු නොවුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ පරීක්ෂා කර පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව. | අදාළ සංඛ්‍යා පිළිබඳ නිශ්චිත තොරතුරු අනාවරණය කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවස්ථා 199 කදී රු.මිලියන 155.56 ක අතුරු අග්‍රිම පුද්ගලික ආයතන වෙත ලබා දි තිබුණි. | ඇතැම් දේශීය හා විදේශීය මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ගෙවීමට සිදු වීම නිසා හටගෙන ඇති තත්ත්වයක් බව. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 (i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්ථන වැය විෂයන් 12 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් එකතුව රු.බිලියන 4.17 ක් කපාහැර නොතිබුණි. | පෙර වර්ෂයේ බැරකම් අධික වීම, සමාලෝචිත වර්ෂයේ, ද්‍රවශීල මුදල් නොලැබීම නිසා ඇති වූ තත්ත්වයක් බව. | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 20 ක් සඳහා එකතුව රු.බිලියන 38.37 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.බිලියන 5.51 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 5 ක් සඳහා එකතුව රු.බිලියන 2.02 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 462.97 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරි කිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 77 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | සකසුරුවම් ලෙස වියදම් කිරීම, ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හා රටතුළ පැවති තත්ත්වය අනුව අදාළ ඉතිරිවීම් සිදු වී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | පුනරාවර්ථන වැය විෂයන් එකොළහකට සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මුදල් රෙගුලාසි 66 යටතේ රු.බිලියන 10.64 ක් වෙනත් වැය විෂයන් වලින් මාරුකරගෙන තිබුණු අතර, එක් පුනරාවර්ථන වැය විෂයකට රු.බිලියන 16.50 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනද සලසා ගෙන තිබුණි. | අතිකාල දීමනා, සලාක දීමනා හා වන්දි දීමනා ඉහළයාම නිසා අතිරේක ප්‍රතිපාදන දැරීමෙන් සිදු වූ තත්ත්වයක් බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වැය විෂයන් හතක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් එය ඉක්මවා වර්ෂ අවසානයට රු.බිලියන 1.25 ක බැරකම් සඳහා බැඳීමට සිදු වී තිබුණි. | පෙර වර්ෂයේ බැරකම් බේරුම් කිරීම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | අංක 222-01-04-1003 (වෙනත් දීමනා), 222-01-02-1202 (ඉන්ධන) හා 222-01-02-1204 (වෛද්‍ය සැපයුම්) දරන වැය විෂයන් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකරගෙන තිබූ පිළිවෙලින් රු.මිලියන 16.30 ක්, රු.මිලියන 321.22 ක් හා රු.මිලියන 324.93 ක් හෙවත් පිළිවෙලින් සියයට 21 ක්, සියයට 27 ක් හා සියයට 30 ක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | සැලසුම්කළ පරිදි ප්‍රසම්පාදනයන් සිදු කිරීමට බාධා එල්ල වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණ වූ පරිදි පුනරාවර්ථන වැය විෂයන් යටතේ වූ රු.බිලියන 1.79 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි. | මෙම බැරකම් ප්‍රමාණය බැඳීම් ප්‍රකාශයට ඇතුළත්ව ඇති බව. | මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදවූ කළ යුතු වීම. |
| (ආ) | විගණන නියැදි පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි සමාලෝචිත වර්ෂයේ එළඹ තිබුණු රු.බිලියන 1.99 ක බැරකම් වටිනාකම තුල එකතුව රු.බිලියන 1.72 ක් මාසය ඉක්මවූ බැරකම් විය. | අක්මුදල් නොලැබීම නිසා ඇති වූ තත්ත්වයක් බව. | මුදල් රෙගුලාසි 94 (1) හා 214 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ආයතන තිස් එකක නියැදියකින් ශේෂ සනාථනයන් කැඳවූ අතර, ආයතන 27 කට ගෙවිය යුතු එකතුව රු.මිලියන 135.22 ක බැරකම් එම ආයතන විසින් සනාථ කර නොතිබුණි. සනාථනයන් ලබාදුන් ආයතන හතරෙන් ආයතන තුනක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ බැරකම් ප්‍රමාණයට වඩා එකතුව රු.මිලියන 8.99 ක් අඩුවෙනුත්, ඉතිරි ආයතනය රු.මිලියන 1.56 ක් වැඩියෙනුත් වාර්තා කර තිබුණි. | මෙම වෙනස්කම් සොයා බැලීමට කටයුතු කරනු ලබන බව. | ශේෂ අතර වෙනස්කම් වලට හේතු නිශ්චිතව හඳුනාගෙන නිවැරදි කිරීම් කඩිනමින් කළ යුතු වීම. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වැය විෂයන් 10 කට අදාළව විවිධ ව්‍යාපෘති/ වැඩසටහන් 16 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 783.41 ක මූලධන ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 35.18 ක ප්‍රතිපාදන | ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති බව. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා |

| | | |
|---|---|---|
| ඉතිරිවීම් තිබුණු අතර, එම ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 4 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. තංගල්ල බාලිකා විද්‍යාලයේ ගොඩනැගිලි අලුත්වැඩියා සිදු කිරීම සඳහා 2022 වර්ෂයේ රු. මිලියන 23.13 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ එම අලුත්වැඩියා සඳහාම රු.මිලියන 24.32 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එයින් රු.මිලියන 17.98 ක් හෙවත් සියයට 74 ක් වැයකර අදාළ අලුත්වැඩියා වලින් සියයට 15 ක් පමණක් නිම කර තිබුණි. | | දුන් ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමෙන් උපයෝජනය කළ යුතු වීම. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ඉක්ම වූ වර්ෂ 32 දක්වා කාල පරාසයක් තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරින් 938 දෙනෙකුගේ හා සිවිල් නිලධාරින් 436 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 33.31 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකරගෙන නොතිබුණි. මෙම ණය ශේෂ වලින් රු.මිලියන 11.94 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණි. | ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මෙම ණය ශේෂ කඩිනමින් අයකරගත යුතු වීම. |
| (ආ) | විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් 50 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරීන් 84 දෙනෙකුගෙන් වර්ෂය ඉක්ම වූ වර්ෂ 20 දක්වා කාල පරාසයක් තුලදී අය නොවූ ණය ශේෂවල එකතුව රු.මිලියන 6.60 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් රු.මිලියන 5.04 ක් වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂ වුවත්, ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මෙම ණය ශේෂ කඩිනමින් අයකරගත යුතු වීම. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනා කම | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති | | | | |
| | i. V හා XLVIII පරිච්ඡේදය වල 7.1 හා 37.1 ඡේද, සහ 214 හා 216 රීති | | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර තනතුර හැර ගිය සේවකයන් 56 දෙනෙකුට තනතුර හැරයාමේ නිවේදන නිකුත් කිරීමට මාස 02 සිට අවුරුදු 10 යි මාස 06 ක් දක්වා ප්‍රමාද කර තිබුණු අතර, මේ නිසා එම නිලධාරීන්ට අභියාචනා කිරීමේ අවස්ථාවද අහිමි වී තිබුණි. | කාර්යාල ව්‍යාප්තිය අධික වීම හේතුවෙන් මෙම ප්‍රමාදය හටගෙන ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | ii. V හා XLVIII පරිච්ඡේද වල 7.4 හා 37.2 ඡේද සහ අංක 215 සිට 220 දක්වා රීති | | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර 1993 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සේවය හැර ගිය නිලධාරින් 126 දෙනෙකු සේවය හැරගොස් මාස 03 ක් ඉක්මවීමෙන් පසුව නැවත සේවයේ යෙදීමට අවකාශය ලබා දී තිබුණු අතර, අවස්ථා කිහිපයකදි සේවය හැරගොස් තිබුණු සේවකයින්ද මෙසේ නැවත සේවයේ පිහිටුවා තිබුණි. | සේවය හැරයාම් සහතික නිකුත් කරනු නොලැබූ අයගේ සාධාරණ ඉල්ලීම් සළකා බලා නැවත සේවයට අවකාශ ලබා දී ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iii. VII වෙනි පරිච්ඡේදයේ 10 වන ඡේදය | සිවිල් පරිපාලන අධ්‍යක්ෂක මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු සේවකයන් 835 දෙනෙකුට හිමි වැටුප් වර්ධක පෙර වර්ෂ කිහිපයක සිට ගෙවීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේදි මෙම ප්‍රමාදයන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 104 (3) | 2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවස්ථා 04 කදී සිදුවී ඇති එකතුව රු.මිලියන 1.50 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර, 2021 හා 2023 වර්ෂවල සිදුවූ අලාභ සිද්ධි 02 කට අදාළව එකතුව රු.මිලියන 2.83 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 07 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. | අලාභහානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්ථා ඉදිරිපත් කිරීම කඩිනම් කිරීමට පියවර ගනිමින් සිටින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| i. 1989 මාර්තු 23 දිනැති අංක 19/89, 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 සහ 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන චක්‍රලේඛයන් | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ 8,325 ක් වූ සමස්ත කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොමැති අතර, සමාලෝචිත වර්ෂයේ වැටුප්, දීමනා හා අතිකාල ලෙස මෙම කාර්ය මණ්ඩලයට එකතුව රු.බිලියන 5.47 ක් ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට ඉදිරියේදි පියවර ගන්නා බව. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. 2005 අගෝස්තු 18 දිනැති අංක 14/2005 චක්‍රලේඛය | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරමින් සිට පසුගිය වර්ෂ 07 තුල විශ්‍රාම ගැන්වූ සේවකයින් 277 දෙෙනකුගේ පෞද්ගලික ලිපිගොනු සම්පූර්ණ කිරීමට මාස 02 සිට වර්ෂ 07 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | ඉදිරියේදි ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බව | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| iii. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | නිසි ඉන්ධන පරීක්ෂාවක් සිදු නොකර යුද්ධ හමුදාව විසින් වාහන 4243 ක් පරිහරණය කර තිබුණි. | 2024 වර්ෂයේ අදාළ පරීක්ෂණ කඩිනම් කිරීමට පියවර ගන්නා බව. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ | | | |
| i. 4.1.1 (ඇ), 8.1.1 (අ), (ආ), 8.11 මාර්ගෝපදේශයන් | සැලසුම් වලට ඇතුළත් නොවීම, අක්මුදල් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබීම සහ මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සහතික නොවීම නිසා රු.මිලියන 872.35 ක ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් අවලංගු කිරීමට සිදුවී තිබුණු අතර, එයින් එකතුව රු.මිලියන 357.32 කට පිරිනමන ලද ප්‍රසම්පාදනයන් 05 ක් අවලංගු කිරීමට හේතුව ගිවිසුම් කාලය අවසන් වීම බව දන්වා තිබුණද, ඒ සම්බන්ධව යථෝක්ත මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අදාළ සැපයුම් ලබා ගැනිමට නොහැකි වීමෙන් යුද්ධ හමුදාවේ ඉදිකිරිම් හා නවීකරණයන් වලට බාධා එල්ල වී තිබුණි. | රට තුළ පැවති තත්ත්වයන් මත ප්‍රසම්පාදන කටයුතු අසමාන්‍ය ලෙස ප්‍රමාද වීමෙන් හටගෙන ඇති තත්ත්වයක් බව. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. 8.9.1(ආ) මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 11 කදී එකතුව රු.මිලියන 8.15 ක වාහන අලුත්වැඩියා කිරීම් හා අමතර කොටස් මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | ඉදිරියේදී සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කරනු ලබන බව. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| iii. 9.3.1(ආ) මාර්ගෝපදේශය සහ 2021 අප්‍රේල් 21 දින සංශෝධන | සමාලෝචිත වර්ෂය තුළ යුද්ධ හමුදාවට විසින් රු.මිලියන 848.65 ක් වැයකර වාහන 663 ක් අලුත්වැඩියා කිරීමේදී රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය ලබාගෙන නොමැති බව. | රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු උපදෙස් | | | |
| 2019 මාර්තු 21 දිනැති අංකTO/BE2/UNINCOME/ARMY දරන හා 2020 ඔක්තෝබර් 28 දිනැති අංක TO/BE2/4/UNINCOME/Army දරන ලිපි | හමුදා භට පිරිස් විදේශ සාම සාධක රාජකාරිවල නියුතු වීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත විදේශ ව්‍යවහාර මුදලින් (ඇමරිකානු ඩොලර්) ලැබෙන ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගොස්තු 31 දින දක්වා ඇමරිකානු ඩොලර් 58,626 ත් 2,332,588 ත් අතර මුදලක් නියමිත දිනට මහා භාණ්ඩාගාරයට බැර නොකර රඳවාගෙන තිබුණි. | එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් තහවුරු කර ගැනීමෙන් පසුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලබන බව. | මහා භාණ්ඩාගාර උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.7 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2 ක් ඉකුත් වු රු.මිලියන 8.82 ක තැන්පතු 123 ක් රජයේ ආදායමට බැර කර නොතිබුණි. | ඉදිරියේදි රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව වැය විෂයයන් 03 ක් සඳහා සියයට සියයක ඉලක්කගත භෞතික ප්‍රගතියක් දක්වා තිබුණ ද, භෞතික කාර්ය සාධනය එක් වැය විෂයක සියයට 50 ත් 74 ත් අතර සහ අනෙක් වැය විෂයන් දෙකෙහි සියයට 75 ත් 89 ත් අතර පැවතුණි. | අක්මුදල් නොලැබීම නිසා හටගත් තත්ත්වයන් වීම. | ඉලක්කගත සැලසුම් කරා ලඟා වීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රු.බිලියන 1.71 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල ආරම්භ කර ඇති කාර්යාලීය ගොඩනැගිලි, තට්ටු නිවාස, නිල නිවාස, බඩු ගබඩා, පොදු විනෝදාස්වාදය සඳහා වූ ගොඩනැගිලි, රෝහල් හා වෙනත් ඉදිකිරීම් 38 ක නිම කිරීමේ ප්‍රතිශතය සියයට 0 සිට සියයට 95 ක පරාසයක පැවතුණු අතර, නිම නොකළ වැඩ වල ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 629.05 ක් විය. | අක්මුදල් නොලැබීම නිසා හටගත් තත්ත්වයන් වීම. | සැලසුම් කළ ප්‍රගතිය වර්ෂ අවසානයේ අදාළ ව්‍යාපෘති වලින් ලබාගත යුතු වීම. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවබෝධතා ගිවිසුමෙන් එකඟ වූ වාහන/උපකරණ හා අමතර කොටස් ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හා උපකරණ හා වාහන ධාවනයට සුදුසු තත්ත්වයේ නොමැති වීම නිසා එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලබාගත හැකිව තිබු ඇ.ඩො. මිලියන 3.33 ක ආදායමක් අහිමිවී තිබුණි. | නාවික කටයුතු ප්‍රමාදය ඇතුළු පාලන කර ගත නොහැකි තත්ත්වයන් මත ඇති වූ තත්ත්වයන් බව. | යථෝක්ත අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 57.23 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව පිළියෙල කර තිබූ ප්රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදන කටයුතු මගින් සපයා ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ සිට යථා පරිදි ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ට අනුව සැලසුම් සකස් කළ යුතු වීම. |
| (ආ) | නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි සීමිත/පාලිත ජාතික තරඟකාරී ක්‍රමය, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය සහ මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු රු.මිලියන 1580.17 ක ප්‍රසම්පාදන වලදී ලංසු විවෘත කරන අවස්ථාව දක්වාත්, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකිරීම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි ක්‍රියා කිරීමට බාධා එල්ල වී තිබුණි. මෙම එක් එක් ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් පිළිබඳව අනාවරණය වූ පොදු කරුණු පහත දැක්වේ. | 2024 වර්ෂයේ සිට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | අංක 2.6.1(අ)(I), (II), (III) හා 5.3.1(ඇ) දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ට අනුව කටයුතු කළ යුතු වීම. |
| i. | 3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් පිළිබඳ නොසළකා රු.මිලියන 1298.81 ක ප්‍රසම්පාදනයන් සඳහා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණු අතර, 4.2.2 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් නොමැති වීම නිසා ප්‍රසම්පාදන කටයුතු සඳහා විශාල කාලයක් ගත වී තිබුණි. තවද, ප්‍රසම්පාදන අත්පොතෙහි 7.4 සහ 7.5 මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ලංසු විවෘත කළ දින සිට තාක්ෂණික කමිටු වාර්තාව ලබා දීමට දින 96 සිට දින 368 ක කාලයක්ද ගත වී ඇති අතර, ඇණවුම් නිකුත් කළ දින සිට අදාළ භාණ්ඩ තොග ගබඩාවට ලැබීම දක්වා දින 42 සිට දින 884 ක කාලයක්ද ගත වී තිබුණි. | ඉදිරියේදී මෙම මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ ප්‍රමාදයන් අවමකිරීම සඳහා එම කටයුතු මනා ලෙස සැලසුම් කළ යුතු වීම. |
| ii. | මිල සැඳහුම් ක්‍රමය යටතේ එකතුව රු.මිලියන 41.20 ක මිලදී ගැනීම් සිදු කිරීමේදී, මිල ගණන් ඉල්ලීම් ලැබුණු බවට විධිමත්ව සනාථ කර නොගැනීමත්, තොග නොපවතින සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ඉල්ලීමත්, නිසා තරඟකාරී මිල ගණන් ලබා ගැනිමට බාධා එල්ල වී තිබුණි. | ඉදිරියේදී මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරනු ලබන බව. | තරඟකාරී මිල ගණන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපාය මාර්ග ක්‍රියාවට නැංවීම සඳහා ආධුනික සෙබලුන් 35,000 කට අවශ්‍ය රෙදිපිළි හා ඇඟලුම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු අතර, පිළිවෙලින් රු.මිලියන 24.92 ක වියදමින් Belt Waist Web OG Pattern 15000 ක්, රු.මිලියන 15.71 ක වියදමින් සිරස්ක (Berets) 24,500 ක්, රු.මිලියන 86.19 ක වියදමින් Cloth polyester Cotton Material මීටර් 87,500 ක් හා රු.මිලියන 187.83 ක වියදමින් Cloth polyester Wool Material මීටර් 45,000 ක් සැලසුම්කළ විද්‍යාගාර පරීක්ෂණයකින්වලින් තොරව මිලදී ගෙන තිබුණු අතර, Belt Waist Web OG Pattern මිලදී ගැනීමේදී ප්‍රධාන පිරිවිතර හතරකට අනුකූල නොවූ ලංසුකරුගෙන් තත්ත්ව පරීක්ෂණයකින් තොරව රු.මිලියන 15.17 ක වැඩි මිලකට මිලදී ගෙන තිබුණු අතර, ණයවර ලිපි නිකුත් කිරීමේ ප්‍රමාදය නිසා විනිමය අනුපාත වෙනස් වීමෙන් අතිරේකව තවත්, රු.මිලියන 6.54 ක් වැයකිරීමට සිදු වී තිබුණි. 2024 පෙබරවාරි මාසය අවසන් වන විටත් නිකුත් කර තිබුණේ මිලදී ගත් සිරස්ක තොගයෙන් සිරස්ක 6,694 ක් හෙවත් සියයට 27 ක් පමණි. ඒ අනුව රු.මිලියන 11.37 ක තොගයක් වර්ෂයකට අධික කාලයක සිට ගබඩාවේ ඉතිරිව පැවතුණු අතර, Cloth polyester Cotton Material තොග සැපයීමට වර්ෂයකට පමණ පෙර සැපයුම්කරුගේ රු.මිලියන 4.89 ක කාර්යසාධන බැඳුම්කරය නිදහස් කර තිබුණි. තවද, Cloth polyester Wool Material මිලදී ගැනීමේදී ගිවිසුම්ගත මිල ගණන් ඉක්මවා රු.මිලියන 3.95 ක වැඩි මිලකට එකඟ වී සැපයුම් ලබා ගෙන තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් හා අමාත්‍යාංශ අනුමැතිය මත කටයුතු කර ඇති බව හා රට තුළ පැවති විනිමය අර්බුදය හා මිල ගණන් ඉහළයාම නිසා හටගත් තත්ත්වයක් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ වඩා සාධාරණ මිල ගණන් යටතේ රජයට වාසිදායක ආකාරයෙන් ප්‍රසම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | රු.මිලියන 299.70 ක් වැයකර 2022 වර්ෂයේ යුද්ධ හමුදාවේ වාර්ෂික අවශ්‍යතාවයන් සඳහා ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය, රසායනාගාර ද්‍රව්‍ය, දන්ත ඖෂධ හා වෛද්‍ය අයිතමයන් ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය යටතේ මිලදී ගැනීමට සැලසුම් කළද, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාදීමේ ප්‍රමාදයන් නිසා රු.මිලියන 277.07 ක පිරිවැයක් යටතේ මිලදී ගැනීමට සැලසුම් කළ ප්‍රසම්පාදනයන් ලංසුකරුවන් දැනුවත් නොකර අවලංගු කර තිබුණු අතර, නැවත මිල ගණන් කැඳවා පෙර මිල ගණන් ඉක්මවා රු.මිලියන 29.63 ක් වැයකර හෙවත්, සියයට 3 සිට සියයට 782 දක්වා ඉහළ මිල ගණන් යටතේ මිලදී ගෙන තිබුණි. තවද, රු.මිලියන 166.09 ක් වටිනා වෛද්‍ය සැපයුම් 2023 ඔක්තෝම්බර් 31 දින වන විටත් සපයා ගැනීමට නොහැකි වී තිබුණි. | රට තුළ පැවති විනිමය අර්බුදය හා අක්මුදල් නොලැබීමෙන් ඇතැම් ප්‍රසම්පාදනයන් සිදු කළ නොහැකි වීම නිසා හටගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් රජයට උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රු.මිලියන 272.08 ක් වැය කර රෙදිපිළි සහ ඇඟලුම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.3 (අ) ප්‍රකාරව පුළුල් ප්‍රචාරයක් ලබාදී නොතිබුණු බැවින් තරඟකාරී ලංසු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මේ යටතේ සිදුකල ප්‍රසම්පාදනයන් කිහිපයක් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය කෙරේ. | ලංසුකරුවන් ප්‍රතිචාර නොදැක්වීමෙන් හටගෙන ඇති තත්ත්වයක් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| i. | රු.මිලියන 6.94 ක් වැය කර Belt sam Browne brown leather with silver fittings ඒකක 650 ක් මිලදී ගැනීමේදී සැපයුම්කරු භාණ්ඩ සැපයීමට දින 166 ක් ප්‍රමාද කර තිබුණද රු.779,217 ක අය කර ගත යුතු ප්‍රමාද ගාස්තු රහිතව දින දීර්ඝයන් ලබාදී තිබුණු අතර, මේ නිසා 2022 වර්ෂයේ නිළ උසස් කිරීම් ලබන හා කෙඩෙඩ් නිලධාරීන්ගේ මූලිකම අවශ්‍යතාවයට යෙදවීමට නොහැකි වී තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කටයුතු කර ඇති බව. | නිසි අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගත හැකි පරිදි ප්‍රසම්පාදනයන් නිසි ලෙස සැලසුම් කළ යුතු වීම. |
| ii. | රු.මිලියන 15.03 ක් වැයකර නිල ඇඳුම් ලාංඡන ඇතුළු ආයිත්තම් ඒකක 700 ක් මිලදී ගැනීමේදී එකඟ වූ පිරිවිතරයන්ගෙන් යුතු අයිතමයන් සැපයීමට සැපයුම්කරු අපොහොසත් වීම හේතුවෙන්, සැපයුම් ලබා දීමට ප්‍රමාද වී තිබුණු අතර, අවස්ථා තුනකදී ප්‍රමාද ගාස්තු රහිතව සැපයුම් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර ඇති නිසා රු.මිලියන 1.80 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනිමට නොහැකිවී තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කටයුතු කර ඇති බව. | සැපයීම් නියමිත කාලයතුල සිදු නොකරන සැපයුම්කරුවන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| iii. | රු.මිලියන 7.5 ක් වැයකර T-Shirt Material Olive Green මීටර් 6250 ක් සහ රු.මිලියන 8.27 ක් වැය කර නිදන මළු 3,920 ක් මැසීම සඳහා 72" පළල ෆැබ්රික් කොටන් රෙදි මීටර් 4,410 ක් මිලදී ගැනීමේදී විධිමත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවකින් වර්ණයේ සහ නිදන මළු රෙදිවල පළලෙහිද වෙනස්කම් පෙන්වාදී තිබියදී එම තත්ත්වයන් නොසලකා මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කටයුතු කර ඇති බව. | තත්ත්ව පරීක්ෂණ වාර්තා සළකා බැලිය යුතු වීම. |
| iv. | රු.මිලියන 12.4 ක් වැයකර 60" පළල නෙට් රෙදි මීටර් 36,000 ක් මිලදී ගැනීමේදී, පලමුවර මිල ගණන් කැඳවීමේදී පැවති සුළු පිරිවිතර දුර්වලතා සැපයුම්කරු සමඟ සාකච්ජා කර නිවැරදි කර ගත්තේ නම් දෙවනවර මිලගණන් කැඳවා මිලදී ගැනිමේදී දැරීමට සිදු වූ රු.මිලියන 3.76 ක අතිරේක පිරිවැය වලක්වා ගත හැකිව තිබුණි. තවද, රු.මිලියන 10.40 ක් වැයකර ලයිනින් රෙදි මීටර් 21,333 ක් මිලදී ගැනීමේදී, තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය නොමැතිව 60" පළල හා සියයට 100 පොලියස්ටර් රෙදි වෙනුවට 46" පළල Polyester Cotton Blended රෙදි මිලදී ගෙන තිබුණි. | විශාල බැහැරවීම් සලකා බලා නැවත මිල ගණන් විමසීමට කටයුතු කර ඇති බව. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත රජයට වඩා වාසි සැලසෙන පරිදි මිලදී ගැනීම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| v. | රු.මිලියන 8.41 ක් වැයකර ලෙදර් වර්ග අඩි 5625 ක් මිලදී ගැනීමේදී, 5.6.1 (අ), මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතරයන් සකස් කර නොතිබුණි. | පළපුරුදු නිලධාරීන් පිරිවිතර සකස් කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | රු.මිලියන 159.36 ක් වැයකර ගොඩනැගිලි හා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී, කාර්යසාධන සුරක්ෂණයන් ලබාගෙන ගිවිසුම් ගත වී නොතිබුණු අතර, රු.මිලියන 25.21 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම, සැපයුම්කරුවන් පැහැරහැර තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදනයන් වලදී ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (උ) | රු.මිලියන 101.14 ක් වැයකර Oracle - 19c පරිගණක මෘදුකාංග බලපත්‍රය මිලදී ගැනීමේදී, පිරිවිතර ලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති සාධක පාදක කර ගෙන ලංසු ඇගයීම් කර තිබුණු අතර, ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 26.30 ක අඩු මිල ලංසුව, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු බව දක්වමින් බැහැර කර තිබුණි. තවද, අදාළ මෘදුකාංගය සම්බන්ධයෙන් මිලදීගත් ආයතනයෙන් ලබාගත යුතු පුහුණුවීම් පිළිබඳව විධිමත්ව එම ආයතනය සමඟ එළැඹි ගිවිසුමෙහි සඳහන් කර නොතිබුණු බැවින්, විධිමත් පුහුණුවීමක් නොමැති වීමෙන් මිලදී ගෙන වර්ෂ දෙකකට අධික කාලයක් ගත වී ඇතත් මෙතෙක් සක්‍රීය කිරීමට නොහැකි වී තිබුණි. | පිරිවිතර ලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති නමුත් යුද්ධ හමුදාව තීරණය කළ පිරිවිතර පාදක කරගෙන ලංසු ඇගයීම් කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර රජයට ආර්ථික වාසි සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඌ) | ලෙබනන් හා මාලි සාමසාධක මෙහෙයුම් සඳහා භාවිතා කරන සන්නද්ධ රථ හා ධාවන පැදි අලුත්වැඩියාව සඳහා රු.මිලියන 72.83 ක් වැයකර අමතර කොටස් මිලදී ගැනීමේදී ලංසුකරුවන්ට මිලගණන් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණු අතර, රු.මිලියන 36.49 ක් වැයකර තොග ඒකක 722 ක් මිලදී ගැනීමේදී පිරිවිතර නිශ්චිතව දක්වා නොතිබීම හේතුවෙන් සියයට 53 සිට සියයට 12643 දක්වා විශාල මිල පරතරයක් සහිතව මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. තවද, ලංසු ඇගයීම සඳහා සහ ප්‍රසම්පාදන කමිටු තීරණ සඳහා මාස 4 ක කාලයක් ගත කර තිබුණු නිසා ඒ අතර කාලයේදී විනිමය අනුපාත වෙනස් වීම නිසා අතිරේකව රු.මිලියන 14.06 ක් දැරීමට සිදු වී තිබුණි. සුසුකි DRZ 400CC ප්‍රහාරක ධාවන පැදි අමතර කොටස් මිලදී ගැනීමේදී මිල ගණන් විවෘත කර පැහැදිලි හේතුවක් නොදක්වා අවලංගු කර තිබුණි. පළමු අවස්ථාවේ බලයලත් නියෝජිත ගේ මිල ගණන්වලට වඩා රු.මිලියන 7.27 කින් වැඩි මිල ගණන් යටතේ දෙවනවර ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදී ගෙන තිබුණි. තවද, වාහන අමතර කොටස් මිලදී ගැනීම සඳහා පළමු අවස්ථාවේදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කළ රු.මිලියන 8.77 ක ලංසුවක් ඉදිරිපත් කළ විදේශීය ආයතනයෙන් මිලදී ගැනීම බැහැර කර, නැවත මිල | රටතුළ පැවති තත්වයන් මත ප්‍රමාදයන් සිදු වී ඇති බව සහ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය පදනම් කරගෙන තාක්ෂණික ඇගයීම් කමිටු සහ අවසන් භාවිතා කරන්නාගේ නිර්දේශ මත මිලදී ගෙන ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර, තරඟකාරී මිල ගණන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගණන් කැඳවා රු.මිලියන 13.30 ක ලංසුවක් ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 4.53 ක් අතිරේකව වැය කිරීමට සිදු වී තිබුණි. Variable transmission system (WMZ551A.08) මිලදී ගැනීමේදී කලින් තීරණය කළ ඒකක දෙකක ප්‍රමාණය එක් ඒකකයක් දක්වා අඩු කිරීම නිසා සියලු සුදුසුකම් සැපිරූ ලංසුකරුවකුගේ ලංසුව බැහැරකර නැවත මිල ගණන් කැඳවීමෙන් රු.මිලියන 4.19 ක් අතිරේකව දැරීමට සිදු වී තිබුණි. | | |
| (එ) | විධිමත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවකින් පිරිවිතර 23 ක් හා එකඟ නොවන හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවකින් සුදුසු නොවන බවට වාර්තා කර තිබුණු Boot Desert යුගල් 1000 ක් රු.මිලියන 26.95 ක් වැයකර මිලදී ගෙන තිබුණි. | අවශ්‍යතාවය මත ඉක්මනින් මිලදී ගැනීමට යාමේදී ඇති වූ තත්ත්වයක් බව. | තත්ත්ව හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා මත ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය මිලදී ගත යුතු වීම. |
| (ඒ) | රු.මිලියන 24.10 ක් වැයකර Heavy Duty Digital Photocopy Machine 20 ක් මිලදී ගැනීමේදී ඇස්තමේන්තු කළ පිටපත් ප්‍රමාණය සහ ස්ථාවර පිරිවැයන් සලකා නොබැලීම නිසා රු.මිලියන 6.74 ක වැඩි මිලක් දැරීමට සිදු වී තිබුණු අතර, මෙයින් එක් ඡායා පිටපත් යන්ත්‍රයක් සාම සාධක මෙහෙයුම් සඳහා යැවීමට වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අඩු විදුලි පරිභෝජනය සැලකිල්ලට ගෙන මිලදී ගෙන ඇති බව. | ඇගයීම් කටයුතු වලදී ඍජු, වක්‍ර සහ කාල පිරිවැයන්ද සලකා බැලිය යුතු වීම. |
| (ඔ) | රු.මිලියන 15.47 ක් වැය කර යුද්ධ හමුදාවේ කර්මාන්ත අංශයේ ටයර් කට්ට නැවත ඇලවීමේ ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ලංසු ලේඛනයේ නිශ්චය කොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතා කර තිබුණි. | මුළු තොග ක්‍රමය යටතේ අවම මිල ගණන් සලකා බලා ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඕ) | රු.මිලියන 12.53 ක් වැයකර Socks Polyester Cotton Olive Green යුගල් 26,650 ක් මිලදී ගැනිමේදී, සාම්පල් සුදුසු බවට පළමු මිල ගණන් කැඳවීමේදී විධිමත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවකින් සනාථ කර තිබියදී, නැවත මිලගණන් කැඳවා රු.මිලියන 5.89 ක වැඩි මිලකට මිලදී ගෙන තිබුණු අතර, අවශ්‍යතාවය සලකා බැලීමකින් තොරව මිලදී ගැනීම නිසා රු.මිලියන 12.43 ක් වටිනා යුගල් 26,449 ක් තොග ලැබී මාස පහකට පසුත් නිකුත් නොවී පැවතුණි. | කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා ඇති වූ තත්ත්වයන් බව සහ වාර්ෂික අවශ්‍යතාවයන් සඳහා මිලදී ගත් තොග බව. | තත්ත්ව පරීක්ෂණ වාර්තා මත ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය අවම මිල ගණන් යටතේ අවශ්‍යතාවය සලකා බලා මිලදී ගත යුතු වීම. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් සඳහා රු.මිලියන 202.27 ක් වැයකර ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී, පරිභෝජන ස්වභාවයේ ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.4.11 මාර්ගෝපදේශය හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නියමයන්ට අනුව පිරිවිතර සකස් කර නොතිබුණු අතර, එහි 2.3.1, 2.3.2 හා 2.3.3 | ආනයන කාල පරිච්ජේදයන් සලකා බලා කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණු බව සහ ඇතැම් ඖෂධ සමාගම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නියමයන් හා |

| | | | |
|---|---|---|---|
| | මාර්ගෝපදේශයන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස්, 4.1.1(ඇ), 4.2.2 හා 4.2.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීමත් සහ ලංසු ඇගයීම සඳහා විශාල කාලයක් ගත කිරීමත් නිසා, ඖෂධ වර්ග 68 ක්ද, ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය 95 ක ප්‍රමාණයකගෙන් සියයට 33 සිට සියයට 99 දක්වා ප්‍රමාණයක්ද 2024 මාර්තු මාසය වන තෙක් මිලදී ගැනීමට නොහැකි වී තිබුණු නිසා රෝගීන්ට එම ඖෂධ පිටතින් මිලදී ගැනීමට සිදු වී තිබුණි. තවද, මිලදී ගත් රු.මිලියන 43.49 ක ඖෂධ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය ලබාගෙන නොතිබුණි. | යුද්ධ හමුදාවට ඖෂධ සැපයීමට අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා හටගත් තත්ත්වයන් බව. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කළ යුතු වීම. |
| (ග) | තත්ත්ව පරීක්ෂණ වාර්තා වලින් බැහැරව රු.මිලියන 37.89 ක් වැයකර පාවහන් යුගල් 2100 ක් මිලදී ගෙන තිබුණු අතර, දින 14 ක් ප්‍රමාද කර ලංසු විවෘත කිරිම, ප්‍රසම්පාදන කටයුතුවල වසර තුනක ප්‍රමාදය නිසා අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට නොහැකි වීම හා විනිමය අනුපාතය වෙනස් වීමෙන් රු.මිලියන 11.31 ක අතිරේක පිරිවැයක්ද දැරිමට සිදු වී තිබුණි. | අක්මුදල් නොලැබීම හා විනිමය අනුපාත ඉහළ යාම නිසා ඇති වූ තත්ත්වයන් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර, ප්‍රමිතියෙන් උසස් ඇඟලුම් ද්‍රව්‍යය මිලදී ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ච) | 2020-2021 කාල පරිච්ඡේදයේ ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපාය මාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ආධුනික සෙබලුන්ට රු.මිලියන 27.32 ක් වැයකර ජර්සි 35,000 ක් මිලදී ගැනීමේදී, ගිවිසුම් ප්‍රකාරව සැපයිය යුතු තොගයෙන් කොටසක් පමණක් සපයා ඉතිරි කොටස සැපයීමට එකඟ වූ මිලට වඩා රු.මිලියන 1.91 ක වැඩි මිලකට එකඟවී මිලදී ගෙන තිබුණු අතර, 2022 වර්ෂයේ ලැබී තිබූ මෙම තොග සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වන විටත් නිකුත් වී නොතිබුණු නිසා, අවපැහැ ගැන්වීමටත් විවිධ ගබඩා පිරිවැයන් දැරීමටත් සිදු වී තිබුණි. මෙම තත්ත්වය මත සැලකිය යුතු තොගයක් අරමුණෙන් බැහැරව සාමාන්‍ය සෙබලුන්ට ලබා දීමට තීරණය කර තිබුණි. | රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීමේ ගැටළු පැන නැගුණු බව හා මේ වන විට අදාළ තොග අනෙකුත් භට පිරිස් වෙත නිකුත් කර ඇති බව. | නිසි පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන රජයට වඩා වාසිදායක කොන්දේසි යටතේ මිලදී ගත යුතු වීම. |
| (ජ) | රු.මිලියන 8.18 ක් වැයකර ජාතික, බෞද්ධ හා යුද්ධ හමුදා ධජ 600 ක් මිලදී ගැනීමේදී , පිරිවිතරයන් හා එකඟ නොවීම නිසා අවස්ථා දෙකකදී ලංසු අවලංගු කර තෙවැනි අවස්ථාවේදී, පෙර අවස්ථා දෙකෙදීම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවකුගෙන් එම පිරිවිතර නොඑකඟතා නොසලකා රු.මිලියන 3.10 ක වැඩි මිලකට ප්‍රසම්පාදනය කරගෙන තිබුණි. | රහසිගතභාවය, විනිවිදභාවය සහ සාධාරණත්වය රැකෙන පරිදි මිල කැඳවීම් සිදු කර ඇති බව. | මිල ගණන් විවෘත කර ලංසු අවලංගු කිරීමේ දී මිල ඇතුළු සංවේදී තොරතුරු ප්‍රසිද්ධ වීමෙන් ඇතිවන තත්ත්වයන් පාලනය කරගත යුතු වීම. |

**3.4 වත්කම් කළමණාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක භට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුලදී මිලදී ගෙන තිබුණු අතර, එම රාජකාරී සඳහා එක් කණ්ඩායමක් පමණක් රපෝර්තු කරවීම හේතුවෙන් මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 4.57 ක් වටිනා රථ හා උපකරණ තොග නිෂ්කාර්යව දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩා කර තිබුණි. | නුදුරේදී රපෝර්තු කිරීමට නියමිතව ඇති භට කණ්ඩායම් වෙත අදාළ භාණ්ඩ, උපකරණ හා සන්නද්ධ රථ ලබාදීමට කටයුතු කරන බව. | මිලදීගෙන ඇති මෙම රථ හා උපකරණ තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 14 ක ඉඩමක් කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් විසින් 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පවරා දී තිබුණු අතර, මෙම ඉඩම නිශ්කාර්යව පැවතීම නිසා අනවසර පදිංචිකරුවන් විසින් බලහත්කාරයෙන් පදිංචි වී සිටින බව 2016 වර්ෂයේදී මැනීම් කටයුතු සිදු කිරීමට යාමේදී යුද්ධ හමුදාව විසින් අනාවරණය කරගෙන තිබුණද, මෙම ඉඩම නිරවුල් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග මන්දගාමී ස්වභාවයක පැවතුණි. | නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සම්බන්ධතාවයෙන් නිරවුල් කර ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතින බව. | යුද්ධ හමුදාවට අයත් වත්කම් නිරවුල් කර ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම සඳහා වාර්ෂිකව රු.මිලියන 132.76 ක් වැය කර ගොඩනැගිලි 25 ක් කුලී පදනම මත යුද්ධ හමුදාවට ලබාගෙන තිබුණු අතර, වර්ෂ 30 කට අධික කාලයක සිට කුලියට ගත් ගොඩනැගිලිද, ඒ අතර විය. මෙම කුලී ගොඩනැගිලි වෙනුවට රජයේ ගොඩනැගිලි සපයා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබූණු අතර, රු. මිලියන 460 ක ඇස්තමේන්තු වියදමකින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඉදිකිරීමට සැලසුම් කළ නිවාස හා ගොඩනැගිලි සැලසුම් කළ පරිදි ඉදිකරනු ලැබුවේ නම් මෙම වියදම අවම කර ගැනීමේ හැකියාව පැවතුණි. | කුලී පදනම මත පරිහරණය කරනු ලැබූ ගොඩනැගිලි 40 න් 15ක් මේ වන විට නිදහස්කර ඇති බව. | යුධ හමුදාවේ කුලී වියදම අවම කිරීම හා සැලසුම් කළ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ වෙනත් ආයතනවලින් ට්‍රැක්ටර් 17 ක්, ඩබල් කැබ් රථ 10 ක්, ජීප් රථ 14 ක්, ධාවන පැදි 9 ක්, ගිලන් රථ 8 ක්, ටේලර් 7 ක්, මිනිපෙල් යන්ත්‍ර 6 ක්, බස් රථ 5 ක්, ට්‍රක් රථ 5 ක්, සිංගල් කැබ් රථ 4ක්, ජල/ඉන්ධන බවුසර් රථ 4 ක් හා වෑන් රථයක්ද, පරිහරණය කරමින් පවතින අතර, මෙම රථ අතුරින් | ධාවනයට නුසුදුසු වාහන 24 ක් අදාළ ආයතන වෙත භාරදීමට කටයුතු කරමින් පවතින බව හා අනෙකුත් වාහන යුද්ධ හමුදාධිපති නමින් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ වත්කම් විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතන වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වාහන 24 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අතර කාල පරිච්ඡේදයේදී සුදුසු ධාවන තත්ත්වයේ නොපවතින නිසා යුද්ධ හමුදා පරිශ්‍රයන් වල ගාල් කර තිබුණි. | | |
| (ඉ) | 2020 හා 2021 වර්ෂවල ජාතිය ගොඩනැගිමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපායමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අපේක්ෂා කළ පරිදි ආධුනික සෙබලුන් 11,307 ක් බඳවා නොගැනීම නිසා, එකතුව රු.මිලියන 270.96 ක් වැයකර මිලදී ගන්නා ලද රෙදිපිළි හා ඇහලුම් වර්ග 47 ක් විගණන දිනය වන විටත් නිකුත් නොවී පැවතුණු අතර, එම රෙදිපිළි හා ඇහලුම් වලින් 2024 පෙබරවාරි මාසය අවසන් වන විට රු.මිලියන 30.96 ක් වටිනා ඇහලුම් වර්ග 11 ක වගකීම් කාලය ඉක්මවා මාස 3 ත් 14 ත් අතර කාලයක් ගතවී තිබුණි. තවද, මෙම අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට සුදුසු, වටිනාකම හෙළිදරවු නොවූ යුද්ධ හමුදාව විසින් මීට පෙර මිලදී ගත් වර්ග 30 කට අදාළ රෙදිපිළි හා ඇහලුම් ඒකක 81,253 ක වගකීම් කාලයද මේ වන විට ඉක්මවා තිබුණි. | ඉදිරියේදී රෙදිපිළි හා ඇහලුම් වගකීම් කාලයක් සහිතව මිලදි ගැනීමට කටයුතු කරන බව. | පැවති තොග තත්ත්වයන් හා අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගත යුතු වීම. |
| (ඊ) | පනාගොඩ යුද්ධ හමුදා රෝහලෙහි පැවති ගිලන් රථ පහෙන් එක් රථයක් 2022 වර්ෂයේ ගිනිගැනීමට ලක්වී ඇතත්, මෙතෙක් අලුත්වැඩියාව නිමකර නොතිබුණු අතර, තවත් ගිලන්රථ තුනක් දීර්ඝ කාලයක් භාවිතයට ගෙන ඇති නිසා වරින් වර කාර්මික දෝෂයන්ට ලක්වෙමින් පැවතුණි. | නිතීමය ක්‍රියාදාමයන් හා ටෙන්ඩර් ක්‍රියා පටිපාටි සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇති බව. | වත්කම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු වීම. |
| (උ) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු විවිධ රෙදි, සපත්තු හා ඇහලුම් ද්‍රව්‍ය සහ නිල ලාංඡන වලින් රු.මිලියන 88.19 ක වටිනා තොග අයිතම 29 ක තොග ඒකක 366,635 ක් නිකුත් නොවී ගබඩාවේ පැවතුණු අතර, එම තොග තත්ත්වයන් ගැන නොසලකා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 16.90 ක් වැය කර Bages of Rank Star Gold, Silver, Black වර්ගවල නිල ලාංඡන 16,000 ක් මිලදී ගැනීම නිසා මෙතෙක් එම තොගද, නිකුත් නොවී පැවතුණි. තවද, 2022 වර්ෂයේ මිලදි ගත් රු.මිලියන 16.53 ක් වටිනා ජර්සි 24,614 ක් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වන විටත් ගබඩාවේ පැවතීම නිසා ඒවායේ පැවතිය යුතු සම්මත ප්‍රමිතින්ට හානි සිදු වී තිබුණු අතර, වටිනාකම රු.මිලියන 963.54 ක් වූ රෙදිපිළි හා ඇහලුම් වර්ග 35 කට අදාළව ඒකක 653,692 ක් සෙමින් චලනය වන තොග ලෙස පැවතුණි. | අදාළ තොග උචිත පරිදි නිකුත් කිරීමට කටයුතු කරන ලබන බව. | අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදී ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | යුද්ධ හමුදාවට අයිති 1,343 ක් හා යුද්ධ හමුදාවට වෙනත් ආයතනවලින් ලැබී ඇති වාහන 47 කට අදාළව සමාලෝචිත වර්ෂයේදිද, රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | රක්ෂණය කළ යුතු වාහන සඳහා කඩිනමින් රක්ෂණාවරණ ලබාගත යුතු වීම. |
| (එ) | යුද්ධ හමුදාව විසින් භාවිතා කරන ලද විවිධ වර්ගයේ හිස් පතොරම් 65,564 ක ප්‍රමාණයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි අපහරණයටත්, ප්‍රදර්ශන භාණ්ඩ ලෙස තැබීමටත් කටයුතු කරන බව. | ආරක්ෂිතව අපහරණය කර රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට ක්‍රියාකළ යුතු වීම. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සලාක හා ඉන්ධන අක්‍රමිකතාවයන් ආශ්‍රිත සිද්ධීන්, රිය අනතුරු සිද්ධීන්, ත්‍රස්තවාදී ප්‍රහාර ආශ්‍රිත සිද්ධීන් හා ත්‍රස්තවාදී නොවන හේතූන් මත ඇති වූ අලාභ හානි සිද්ධි වලින් වසර 10 කට වැඩි සිද්ධි 90 කට අදාළව රු.මිලියන 282.48 ක අලාභයක්ද, වසර 05 ට වැඩි වසර 10 ට අඩු සිද්ධි 109 කට අදාළව රු.මිලියන 12,861.24 ක අලාභයක්ද වසර 05 ට අඩු සිද්ධි 204 කට අදාළව එකතුව රු.මිලියන 336.16 ක අලාභයක්ද, පැවති අතර, මේ තුල 1990 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු වූ රිය අනතුරු 159 ක්ද ඇතුළත්ව තිබුණි. මෙම අලාභ හානි අයකර ගැනීමේ හෝ කපා හැරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වභාවයක පැවතුණි. | ඇතැම් අලාභහානි සිදුවීම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහ අනෙකුත් පාඩු හානි නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අදාළ අලාභ හානි සුදුසු පරිදි කපාහැරීමේ හෝ අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු බව. |
| (ආ) | සිද්ධීන් 94 කට අදාළව එකතුව රු.මිලියන 59.18 ක පසුගිය වර්ෂ අවසාන ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂ ලෙස වාර්තා කර නොතිබුණු අතර, පසුගිය වර්ෂයේ අලාභ හානි සිද්ධි 10 කට අදාළව රු.මිලියන 12.66 ක් වැඩියෙන්ද, සිද්ධි 35 කට අදාළව රු.මිලියන 22.42 ක් අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේ පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනැවිත් තිබුණි. | අදාළ සිදුවීම සබැඳිව ක්‍රියාකර අවසන්ව ඇති බැවින් සහ ඇතැම් අලාභහානි වල අගයන්ගේ පරස්පරතාවයන් හේතුවෙන් ඇති වූ තත්ත්වයන් බව. | අවසාන ශේෂ හා ආරම්භක ශේෂ අතර වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සලාක අංශයේ හා රජක සේවා අංශයේ අක්‍රමිකතාවයන් සහ ත්‍රස්ථවාදී හා ත්‍රස්ථවාදී නොවන ප්‍රහාර සිද්ධි 69 කට අදාළව එකතුව ලෙස රු.මිලියන 157.65 ක් කපාහැර තිබුණද, ආරම්භක කපානොහල ශේෂයන්, කපාහල අගයන් සහ ඊට අදාළ අනුමැතින් වල යොමු අංක පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය මගින් හෙළිදරවු කර නොතිබුණි. | කාර්යාල ප්‍රමාද දෝෂයක් හේතුවෙන් හෙළිදරවු කිරීමට නොහැකි වී ඇති බව. | අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරවු කළ යුතු වීම. |

**3.6 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 03 කට අධික කාලයක සිට සිවිල් පරිපාලන අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතින අතර, මේ සඳහා ස්ථිර නිලධාරියකු පත්කිරීමට විගණන දිනය දක්වාත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව. | අදාළ පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම. |
| (ආ) | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්ෂ අවසානයට තත්‍ය සේවක සංඛ්‍යාව 8252 ක් වූ අතර, සේවකයන් පිළිබඳ නිසි යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා නොගැනීම නිසා සේවකයන් විශ්‍රාම ගැන්වීම, වැටුප් වර්ධක සැකසීම, නිවාඩු පරිපාලනය ඇතුළු විවිධ පරිපාලන දූර්වලතා හටගෙන තිබුණි. | සුදුසු දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට මේ වන විටත් ක්‍රියා කරමින් පවතින බව. | කඩිනමින් විධිමත් දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතු වීම. |
| (ඇ) | 2017 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු තීරණයක් මත 2019 වර්ෂයේ මොරටුව විශ්ව විද්‍යාලය මගින් යුද්ධ හමුදාවේ වැටුප් හා දීමනා ගෙවීමේ දත්ත පද්ධතියේ සංවර්ධනය කළ යුතු අංශ පිළිබඳව නිගමන හා නිර්දේශ 18 ක් හා 2004 වර්ෂයේ සිට යුද්ධ හමුදාව විසින් එම පද්ධතියේ හඳුනාගෙන ඇති දෝෂ 72 ක් නිවැරදි කිරීමට අපොහොසත් වී තිබීම නිසා වැටුප් හා දීමනා අඩුවෙන් හා වැඩියෙන් ගෙවීම් මෙන්ම, විවිධ අවිධිමත් ගෙවීම්ද සිදු වී තිබුණු අතර, මේ නිසා වාර්ෂිකව රු. බිලියන 140 ඉක්මවා සිදු කරන වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් දැඩි අවදානමක් පැවතුණි. තවද, වර්ථමානයේ හමුදා සමාජිකයින්ට ලබා දෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ නියාමනය කිරීමට හැකි වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීමටද කටයුතු කර නොතිබුණි. | අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි මාර්ගගත ක්‍රමවේදයන්ද භාවිතා කරමින් සියලු විගණන නිරීක්ෂණයන් පිළිබදව ද වැඩි අවධානයක් යොමු කරමින්, නව වැටුප් හා ලේඛණ තොරතුරු කළමණාකරණ පද්ධතියක් (P&RIMS) නිර්මාණය කිරීම ආරම්භ කර ඇති බැවින් අදාළ නිරීක්ෂණ සියල්ල මගහරවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | යෝජනා සහ නිර්දේශ, විගණන නිරීක්ෂණ වලින් පෙන්වාදුන් දූර්වලතා හා මෘදුකාංග උපදේශන ආයතන විසින් කර ඇති යෝජනා පිළිබඳව අවධානය යොමුකර වැටුප් හා දීමනා සම්බන්ධ අවදානම අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වේරහැර යුද්ධ හමුදා රෝහල තුළ පිහිටි ඖෂධ ගබඩා ගොඩනැගිල්ල සෞඛ්‍ය අමාත්‍යාංශ සහ ඖෂධ නියාමන අධිකාරියේ හා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණු අතර, ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණද, එම අවශ්‍යතාවය මෙතෙක් සම්පූර්ණ කර ගෙන නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බව හා ප්‍රතිපාදන ලැබෙන පරිදි වැඩ නිම කිරීමට අපේක්ෂා කර ඇති බව. | සැලසුම් කළ පරිදි අදාළ ගොඩනැගිල්ල ඉදිකර, ආරක්ෂිතව ඖෂධ ද්‍රව්‍ය ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපනයනය ඉලක්ක කරගත් බෝග වගාව, කාබනික පොහොර නිෂ්පාදනය, සෞඛ්‍ය සේවාව පුළුල් සහ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම, ප්‍රශස්ත වෛද්‍ය සේවාවක් සැපයීම සඳහා ගිලන් රථ අවශ්‍යතාවය සපුරා ගැනීම, රණවිරු පවුල්වල සාමාජිකයන්ට තොරතුරු පුහුණු පාඨමාලා පැවැත්වීම, අගුණකොලපැලැස්ස ගබඩා සංකීර්ණයේ ආරක්ෂක මුර කුටි ඉදි කිරීම, ගජසිංහපුර ගබඩා සංකීර්ණයේ නිලධාරි නේවාසිකාගාරය ඉදිකිරීම හා රථ වාහන අනතුරු පිළිබඳ යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීමේ දේශණ පැවැත්වීම යන ඉලක්කයන් වෙත සමාලෝචිත වර්ෂයේදී ළඟාවීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි**.** | ඇතැම් අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපෘති අවසන් අදියරයේ පවතින බවත් ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාල පමාවක් පවතින බව. | තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදා කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 52,321 ක් හා සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් හා තෘතීක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 39 ක් ඇතුළුව පුරප්පාඩු 2,894 ක් ලෙස සමස්ථ පුරප්පාඩු 55,215 ක් පැවතුණි. | රාජ්‍ය සේවයට බඳවාගැනීම් සීමාකර ඇති බැවින් ඊට අනුගතව යුද්ධ හමුදාව කටයුතු කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැළපෙන ආකාරයට අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |